**ශීර්ෂය - 425 වී හා ධාන්‍ය,කාබනික ආහාර,එළවළු, පළතුරු,මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

වී හා ධාන්‍ය,කාබනික ආහාර, එළවළු, පළතුරු,මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වී හා ධාන්‍ය,කාබනික ආහාර,එළවළු, පළතුරු,මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අගෝස්තු 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වී හා ධාන්‍ය,කාබනික ආහාර,එළවළු, පළතුරු,මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු

අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල ඒසීඑස් - 3 ආකෘතියෙහි දක්වා ඇති පරිදි 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රේෂණ කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙන්වන මුදල් ශේෂය රු. 5,795,693 ක් විය. එම ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මූල්‍ය වත්කම් යටතේ මාර්ගස්ථ මුදල් ලෙස දැක්විය යුතු වුවත් අමාත්‍යාංශය එලෙස දක්වා නොතිබුණි. | රජයේ ගිණුම් සැකසීම සඳහා නිකුත් කරන ලද 2021.11.26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 අනුව අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති ආකාරය නිවැරදි වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වන්නේ 2021/12/31 දිනට ආයතන පොත් අනුව ශේෂය බවට දක්වා ඇත.ඒ අනුව ආයතන පොත් අනුව ශේෂය නිවැරදි බව දන්වා සිටිමි. එමෙන්ම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ආකෘතියේ මාර්ගස්ථ මුදල් පෙන්වීමට විශේෂිත ස්ථානයක් නොමැත. ඒසීඒ 3 ආකෘතියේ සටහන 1 මගින් භාණ්ඩාගාර පොත්වල නොපෙන්වන මාර්ගස්ථ මුදල් ශේෂය පෙන්නුම් කර ඇත. | ප්‍රේෂණය කළ එහෙත් භාණ්ඩාගාරයට නොලද මුදල් මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්විය යුතුය. |
| (ආ) | සබරගමුව පළාත් සභාව සහ මහවැලි අධිකාරිය වෙත ලබා දෙන ලද අග්‍රිමයෙන් 2021 දෙසැම්බර් 31 දිනට පියවිය නමුත් නොපියවූ මුදල් පිළිවෙලින් රු. 9,642,131 ක් සහ 18,195,192 ක් විය. මෙම මුදල් නොපියවූ අග්‍රිම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර අදාළ අග්‍රිම ශේෂ පියවා තිබුණේ 2022 මාර්තු 31 හා මාර්තු 03 යන දිනයන් වලය. | <u>සබරගමුව පළාත් සභාව - රු. 9,642,131</u><br>ඉඩම් පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2021.12.24 දිනැති හා අංක AGM/2121804 දරන ලිපියෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද පහත හේතු මත කොන්ත්‍රාත් කාලය දිගුකිරීමට සිදුවීම නිසා 2022 වර්ෂයේදී උප අග්‍රිම පියවීමට කල් ඉල්ලා ඇත. වෙළඳපොලේ අමුද්‍රව්‍ය හිඟය නිසා තාක්ෂණික උපදෙස් ලබාගැනීමට සිදුවීමත්, කෝවිඩ් තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පැවතීමත් නිසා නිලධාරීන් සේවයේ යොදවා ගැනීම සීමා වීම, ද්‍රව්‍ය මිලදී ගැනීම නතර වීම හා දේශගුණික බලපෑම මීට හේතුවී ඇත.<br><u>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය රු. 18,195,192</u><br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්ගේ 2021.12.21 දිනැති හා අංක MASL/FIN/AMTC Form/ 03/2021 දරන ලිපියෙන් AMTC ගොවිපොල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා උපකරණ මිලදී ගැනීමට ඇණවුම් කර ඇති බවත්, පවතින කෝවිඩ් තත්ත්වය හා වෙනත් ආර්ථිකමය හේතු නිසා එම ඇණවුම් කල භාණ්ඩ 2021.12.31 දිනට ප්‍රථම මිලදී ගැනීමට ඇති ප්‍රායෝගික අපහසුතා සඳහන් කර ඉහත උප අග්‍රිම මුදල 2022 වර්ෂයේ පියවීමට කාලය ඉල්ලීම් කර ඇත. ඉහත ආයතනවල ඉල්ලීම අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා | වර්ෂයට අදාළව ලබාදෙන අග්‍රිම වර්ෂය අවසාන දිනට පියවාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුමැතිය ඉල්ලීම් කළ නමුත්,අග්‍රිම පියවීම සඳහා කාලය දීර්ඝ කිරීමට අනුමැතියක් දිය නොහැකි බවට 2022.01.18 දිනැතිව දන්වා තිබුණි. ඒ අනුව 2021.12.31 දිනට අග්‍රිම පියවීමට නොහැකි විය. 2022/2/23, 2022/3/14 දිනැතිවද, නොපමාව මෙම අත්තිකාරම් පියවන ලෙස දන්වා ලිපි යවා ඇත. මේ වන වට ඉහත අග්‍රිම පියවා ඇති බවද දන්වා සිටිමි. | |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ පිය විය යුතු රු.687,041 ක මුදල එදිනට නොපියවීම නිසා නොපියවූ අග්‍රිම ලෙස දක්වා තිබුණු අතර එම මුදල පියවා තිබුණේ 2022 ජනවාරි 07 දිනය. | 2021.12.31 දිනට පියවීමට නියමිතව තිබූ වයඹ පළාත වෙත ලබා දුන් අත්තිකාරම් මුදලින් ඉතිරි මුදල් වටිනාකම රු.684,041.38 ක මුදල පියවීම සඳහා වූ චෙක්පත 2021.12.31 දින වන විට පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වයඹ පළාත් ප්‍රධාන ලේකම් වෙත නිකුත් කර තිබුණි. නමුත් පළාත් සභාවෙන් 2021.12.31ට මෙම අමාත්‍යාංශය වෙත චෙක්පතක් නිකුත් නොකළ අතර 2022.01.06 දින අමාත්‍යාංශ බැංකු ගිණුම වෙත බැර කර ඇත. | වර්ෂයට අදාළව ලබාදෙන අග්‍රිම වර්ෂය අවසාන දිනට පියවාගත යුතුය. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවශ්‍යතාවයන් හඳුනාගෙන වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන සලසා නොගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 03 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක එකතුව රු.495,260,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අංක 21/1596/304/134 හා 2021.08.31 දිනැති වූ රාජ්‍ය වියදම් සමාලෝචනය අනුව භාණ්ඩාගාරය වෙත අපේක්ෂිත ප්‍රතිපාදන ඉතිරිය යැවූ නමුත් භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන පවරාගෙන නැත. | සලසාගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදි පුරෝකථන සිදු නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 10 ක හා පුනරාවර්තන වැය විෂයයන් 19 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට 96 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. උක්ත ප්‍රාග්ධන හා පුනරාවර්තන වැය විෂයයන් සඳහා සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.5,582,900,000 ක් වූ අතර ඉන් රු.2,749,284,009 ක් එනම් සියයට 49 ක් ඉතිරි වී තිබුණි. | වැය ශීර්ෂ 425-1-2-0-1001, 1002,1003, 1101, 1201, 1202, 1203,1301, 1302, 1402, 1506 සඳහා 21/1596/304/134 අංක හා 2021/8/28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රාජ්‍ය වියදම් සීමාකර ප්‍රතිපාදන පැවරුවද භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන පවරාගෙන නැත. | සලසාගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 (1) (අ) | පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය, ඊට හේතු නිශ්චය වශයෙන් දැන ගැනීම හා එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් 2021 මාර්තු 01 දින අනතුරට ලක්වී තිබුණු අමාත්‍යාංශය විසින් භාවිතා කරන ලද අංක KW- 8202 දරන ජීප් රථය සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | රජයට අයත් රථයක් අනතුරට පත්වීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය කළ යුතු මූලික පියවරයන් සියල්ල සිදු කළද මු. රෙ 104 පරීක්ෂණ වාර්තා සකස් කිරීම ප්‍රමාද විය. දැනට සිදු කෙරෙන මු. රෙ 104 (4) අවසන් පරීක්ෂණ වාර්තාව ලැබී ඇති අතර, එම කමිටුව විසින් රථය අලුත්වැඩියා කර ගැනීම සුදුසු බවට නිර්දේශ කර ඇත. | මු.රෙ.104 (1) (අ) ප්‍රකාරව පරීක්ෂණයකින් වගකිව යුත්තන් නිශ්චය කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 110 | රෙගුලාසි ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර ඇත. | මු.රෙ.110 ප්‍රකාරව හානි පිළිබඳව ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 1646 | වාහනවල ගමන් පිළිබඳ මාසික සාරාංශවල මුල් පිටපත් හා ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් 2021 වර්ෂයට අදාළව | 2021 වර්ෂයට අදාළ සියලු ධාවන සටහන් භාරදී ඇති අතර ඉදිරියේදී සෑම මසකම 15 දිනට පෙර එම ධාවන සටහන් භාර දීම සඳහා කටයුතු කරන ලෙස ප්‍රවාහන අංශයේ නිලධාරීන් දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහනවල ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අමාත්‍යාංශය භාවිතා කරන ලද වාහන 22 කට අදාළ ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | |

**2.4** **බැරකම් හා බැදීම් වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ වාහන සඳහා සලසා තිබුණු රු.2,850,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් වර්ෂය තුළ රු.2,846,235 ක් උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිවීම් රු.3,865 ක් විය. එහෙත් ඉතිරිය ඉක්මවා රු. 891,061 ක බැදීම් හා බැරකම් වලට බැදී තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් හා බැදීම් ඇතිකර නොගත යුතුය. |

**2.5** **අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 371 (5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්යය අතුරු අග්‍රිම නිරවුල් කළයුතු වුවත් අමාත්‍යාංශයේ නිලධාරීන් හත් දෙනෙකු විසින් අවස්ථා 16 කදී ලබාගෙන තිබුණු රු. 256,858 ක අතුරු අග්‍රිම පියවීම සඳහා දින 03 සිට දින 101 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | ඉදිරියේදී දින 10ක් තුළ අත්තිකාරම් පියවන ලෙසට නිලධාරීන් දැනුවත් කිරීමට අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. | මු.රෙ. 371 (5) විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.6** **බැංකු ගිණුම් මෙහෙය වීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනෙන් පසු මෙම ශීර්ෂය අහෝසිවී ඇතිමුත් අමාත්‍යාංශය සඳහා විවෘත කරන ලද බැංකු ගිණුම 2022 මැයි 30 දින වන විටත් වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල වෙත නිකුත් කරන ලද චෙක් පත් 3ක් මේ වන තුරුත් නිෂ්කාශනය වී නොමැති බැවින් ගිණුම වසා දැමීමට නොහැකි විය. නොපමාව බැංකු ගිණුම වසා දැමීමට කටයුතු කරන බව දන්වමි. | බැංකු ගිණුම වසා දැමීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත්ව තිබුණු රු.මිලියන 257ක පිරිවැයට ඇස්තමේන්තු කරන ලද ක්‍රියාකාරකම් 12 ක් ඉටුකර නොතිබුණි. | කොවිඩ් 19 තත්ත්වය යටතේ හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබීම නිසා සමහර ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකිවී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කාර්යයන් වර්ෂය තුළ ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය යටතේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන 15 ක් ඇති නමුත් වේයන්ගොඩ ආර්ථික මාධ්‍යස්ථානයේ ඉඩම හා ගොඩනැගිල්ල පමණක් තක්සේරුකර තිබුණු අතර, ඉතිරි ආර්ථික මධ්‍යස්ථානවලට අදාළ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් බැවින් හා ප්‍රමාණවත් තරම් නිලධාරීන් අමාත්‍යාංශය වෙත නොලැබුන බැවින් මෙම කාර්යය නිසි පරිදි ඉටුකරගත නොහැකිවිය. අංක 2281/41 දරන 2022.05.27 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ආර්ථික මධ්‍යස්ථාන වෙළඳ අමාත්‍යාංශය වෙත පවරා ඇති බවද, දන්වමි. | අමාත්‍යාංශයට අයත් සියලුම ආර්ථික මධ්‍යස්ථාන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

### 3.3 කළමනාකරණ දුර්වලතා

#### 3.3.1 ජීවතුරු උදාන ජාතික වැඩසටහන

ගර්භනී මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 5 ට අඩු ළදරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම අරමුණු කරගනිමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව ‘‘ජීව තුරු උදාන’’ ජාතික වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා 2021 මැයි මස 04 දිනැති අංක අමප/21/0689/323/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. මේ යටතේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ සහයෝගයෙන් සෑම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසමකම තෝරාගත් ප්‍රතිලාභී පවුල් 100 ක් වන පරිදි මුරුංගා පැළ දසලක්ෂයක් ගෙවතු දසලක්ෂයක සිටු වීම සඳහා 2021 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශයේ ආහාර සුරක්ෂිතතාවය වැය විෂයගෙන් රු.මිලියන 55.62ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 41.96 ක් පිරිවැයවූ මුරුංගා පැළ 999,211 ක් බෙදා හැර තිබුණි. ඒ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද 2021 අප්‍රේල් 06 දිනැති අංක Pa/36/2021 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා අංක 3:2 යටතේ ඉහත වැඩසටහනට අවශ්‍ය මුරුංගා බීජ පැළ දිස්ත්‍රික්කයේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළ තවාන් 33 තුළින් සපයා ගැනීමට ප්‍රමුඛත්වය ලබා දීමට හා එසේ නොහැකි වූ විට පමණක් ලියාපදිංචි පෞද්ගලික පැළ තවාන්කරුවන්ගෙන් මිලදී ගැනීමට යෝජනා කර තිබුණි. එහෙත් උක්ත වැඩසටහන සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළතවාන් වලින් මුරුංගා පැළ මිලදී ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ දිස්ත්‍රික් පැළතවාන් සමඟ සාකච්ඡා කළ බවට කිසිදු ලේඛනයක් ලිපිගොනුව තුළ අන්තර්ගත වී නොතිබුණු හෙයින් අමාත්‍ය මණ්ඩල නිර්දේශයන්ට පටහැනිව පෞද්ගලික පැළ තවාන්කරුවන්ගෙන් පමණක් මුරුංගා පැළ මිලදී ගැනීමට ක්‍රියාකර තිබූ නමුත් පැළ තවාන් කරුවන් තෝරාගත් පදනම පැහැදිලිකර නොතිබුණි. | දේශීය වශයෙන් මුරුංගා බීජ නිෂ්පාදනයක් සිදු නොවන බැවින් හා කොවිඩ් වසංගත තත්ත්ව යටතේ ආනයන හැකියාව තිබූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි, A ශ්‍රේණියේ යටතේ ශ්‍රේණි ගත කරන ලද, විශාල පරිමාණයෙන් පැළ නිෂ්පාදනය කරන පැළ සැපයුම්කරුවන් මඟින් මුරුංගා බීජ පැළ වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට හැකියාවක් පැවති බැවින් හදිසි අවශ්‍යතාවය සලකා එලෙස ලබා ගැනීම සඳහා කටයුතු කරන ලදී. | පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය. |
| (ආ) | අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා අංක 3.3 හා 3.4 අනුව දිස්ත්‍රික්කය තුළ පැළ අවශ්‍යතාවය සපුරා ගැනීමේදී දිස්ත්‍රික්කයේ සියලුම ලියාපදිංචි පැළ තවාන්කරුවන්ට අවස්ථාව සැලසෙන පරිදි දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් මගින් ඒ ඒ පැළ තවාන් වලින් මිලදී ගනු ලබන පැළ ප්‍රමාණය තීරණය කළ යුතුව ඇතත් එවැනි දිස්ත්‍රික් කමිටු පිහිටුවීමකින් තොරව සහ දිස්ත්‍රික් පැළ තවාන්කරුවන්ගෙන් මිලදී නොගෙන තෝරාගත් පැළ තවාන්කරුවන් 15දෙනෙකුගෙන් පමණක් පැළ මිල දී ගැනීමට කටයුතු කර තිබුණි. | මූලික අදියරට අනුව පැළ 673,500ක සංඛ්‍යාවක් 2021.04.17 දිනට පෙර අදාළ වසම් වලට බෙදා දීමට සිදුව තිබිණි. මෙම කාල වකවානුව තුළ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තිබූ කාලය ඉතා කෙටි කාලයක් බැවින් දිස්ත්‍රික් කමිටු රැස්කර තීරණ ගැනීමට කල්ගත වන බැවින් අදාළ කමිටු සාමාජිකයන් දුරකථනයෙන් සම්බන්ධ කර පැළ මිලදී ගැනීමට කටයුතු කරන ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් දැනුවත් කර ඇත. ඒ අනුව ඒ වන විට පැළ තවාන්කරුවන්ගෙන් මුරුංගා පැළ නිෂ්පාදනය කර තිබූ පැළ තවාන් 15කින් මුරුංගා පැළමිලදී ගැනීම සිදු කර ඇත. | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) පැළ සපයා ඇති පැළ තවාන් කරුවන් 15දෙනා අතරින් පැළ තවාන්කරුවන් 4 දෙනෙකු සපයා ඇති 700,000කට අධික පැළ ප්‍රමාණයන් සැලකිල්ලට ගැනීමේදී මෙම ව්‍යාපෘතිය සඳහා පැළ සැපයීමට පූර්ණ සූදානමකින් කටයුතු කර ඇති බව හා එම පැළ තවාන්කරුවන් වෙතින් මිලදී ගැනීමට සැලසුම් සහගතව ක්‍රියාකර තිබුණි. | දේශීය වශයෙන් මුරුංගා බීජ නිෂ්පාදනයක් සිදු නොවන බැවින් හා කොවිඩ් වසංගත තත්ත්ව යටතේ ආනයන හැකියාව තිබූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි, **A** ශ්‍රේණියේ යටතේ ශ්‍රේණියේගත කරන ලද, විශාල පරිමාණයෙන් පැළ නිෂ්පාදනය කරන පැළ සැපයුම්කරුවන් මගින් මුරුංගා බීජ පැළ වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට හැකියාවක් පැවති බැවින් හදිසි අවශ්‍යතාවය සලකා එලෙස ලබා ගැනීම සඳහා කටයුතු කරන ලදී. | පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය. |
| (ඈ) දිස්ත්‍රික් කෘෂිකර්ම දෙපාර්තමේන්තු තොරතුරු වලට අනුව ක්ෂේත්‍රයේ සිටුවීම දක්වා පැළයක් සකස් කිරීමට ගතවන කාලය සති 06ක් හා පැළයක පිරිවැය ආසන්න වශයෙන් රු.24 ක් විය. අදාළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම දක්වා ප්‍රවාහනයද ඇතුළුව මුළු පිරිවැය රු.30කට වඩා අඩුවේ. ඒ අනුව සති 06කට පෙර ව්‍යාපෘතිය සැලසුම් කර කෘෂිකර්ම දෙපාර්තමේන්තු පැළ තවාන් මගින් පැළ සපයා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මිලදීගත් පැළ තොගයෙන් රජයට ආසන්න වශයෙන් රු.11,990,532 ක පාඩුවක් සිදු වී තිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුරුංගා බීජ පැළයක් 2021 වර්ෂයේ අප්‍රේල් මිල ගණන් අනුව රුපියල් 50ක් වේ. ඒ අනුව, ලියාපදිංචි පැළ තවාන්කරුවන් විසින් කළ යෝජනාවට අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රු.50/- ක් වන මුරුංගා බීජ පැළයක් ලියාපදිංචි පැළයක් රු. 42.00 ක මිලකට ප්‍රවාහන ගාස්තු අය කිරීමකින් තොරව ලියාපදිංචි පැළ පදිංචි පැළ තවාන් කරුවන්ගෙන් මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.මුරුංගා බීජ පැළයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මිලදී ගන්නේ නම් රුපියල් 50ක මුදලක් හා ප්‍රවාහන ගාස්තුද ගෙවිය යුතු බැවින් මෙම මිලදී ගැනීම තුළින් රජයට පාඩුවක් සිදු වී නොමැත. | පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය. |
| (ඉ) වැඩසටහනේ ක්‍රියාකාරී සැලැස්මට අනුව දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් පිරිවැය රු.මිලියන 4කට සීමා විය යුතු වුවත් සත්‍ය වියදම රු.5,840,469 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් සඳහා රු.1,840,469 ක් වැඩිපුර වියදම් කර තිබුණි. | පුහුණු කිරීම් සඳහා ඇස්තමේන්තුගත රු.මි.4ක ප්‍රතිපාදනය ඉක්මවී ගියද, උක්ත වැඩසටහනට අදාළ මුළු ඇස්තමේතුගත ප්‍රතිපාදනයෙහි ඉක්මවීමක් සිදුවී නොමැත. | -එම- |

(ඊ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදෙමින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයෙහි ලේකම් විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත නිකුත්කර ඇති 2021 අප්‍රේල් 03 දිනැති අංක 03/2021/දරන චක්‍රලේඛයෙහි 4 වගන්තිය අනුව අදාළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම වෙත මිලදී ගනු ලබන පැළ ප්‍රවාහනය කළ යුතු වේ. ඒ අනුව පැළ බෙදාහැරීම අදාළ වසම තුළ සිදු වී ඇති නමුත් ගොවිජන සේවා මධ්‍යස්ථානයන් අසල පැළ බෙදා හැරීම සම්බන්ධයෙන් බැනරයක් ප්‍රදර්ශනය සඳහා රු.1500 ක් ලෙස රු.350,999 ක නිෂ්කාර්ය ප්‍රචාරණ වියදමක් දරා තිබුණි.

මුරුංගා පැළයක් පමණක් බෙදා දීමෙන් ඔබ්බට ජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම උදෙසාත්, ඒ තුළින් ඉහත සඳහන් පුද්ගල කාණ්ඩ තිරසාර පෝෂණීය ප්‍රභවයක් තුළින් මන්දපෝෂණයෙන් පෙළීම අවම කිරීම උදෙසාත් එම කරුණ ද, ඇතුළත් කරමින් බැනරය සකස් කරන ලදී.

නිෂ්කාර්යය වියදම් නොදැරීමට කටයුතු කළ යුතුය.

(උ) දිස්ත්‍රික්කවලට ලබා දිය යුතු පැළ ප්‍රමාණය ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2021 අප්‍රේල් 07 දිනැති අංක "7/5/11-05-ජීවතුරු උදාන" දරන ලිපිය මගින් දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් වෙත දන්වා ඇතත් එහි සඳහන් ප්‍රමාණයන්ගෙන් පරිබාහිරව අවස්ථා 04 ක දී වැඩිපුර පැළ ද, අවස්ථා 03ක දී අඩුවෙන් පැළ බෙදා දී තිබුණි.

**<u>වැඩිපුර පැළ බෙදා හරින ලද අවස්ථා</u>**

| දිස්ත්‍රික්කය | බෙදා දීමට නියමිත පැළ ප්‍රමාණය | බෙදා දුන් පැළ ප්‍රමාණය | වැඩිපුර බෙදා දුන් ප්‍රමාණය | වැඩිපුර බෙදාදුන් (%) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ----------- | --------- | -------- | -------- | ------ |
| iකිලිනොච්චිය | 1,400 | 8,000 | 6,600 | 471 |
| ii ත්‍රිකුණාමලය | 10,000 | 22,000 | 12,000 | 120 |
| iiiමන්නාරම | 9,200 | 13,000 | 3,800 | 41 |
| ivමුලතිව් | 4,600 | 9,000 | 4,400 | 95 |

**<u>අඩුවෙන් පැළ බෙදා දුන් අවස්ථා</u>**

| දිස්ත්‍රික්කය | බෙදා දීමට නියමිත පැළ ප්‍රමාණය | බෙදා දුන් පැළ ප්‍රමාණය | අඩුවෙන් බෙදා දුන් ප්‍රමාණය | අඩුවෙ බෙ දුන් (% ප්‍රතිශත |
|---|---|---|---|---|
| --------- | --------- | --------- | --------- | ----- |
| iකළුතර | 56,500 | 32,135 | 24,365 | 4 |
| iiපොළොන්නරුව | 22,500 | 14,528 | 7,972 | 3 |
| iiiරත්නපුර | 46,700 | 36,178 | 10,522 | 2 |

"ජීව තුරු උදාන" මුරුංගා පැළ දස ලක්ෂයක් සිටුවීමේ වැඩසටහන යටතේ කිළිනොච්චිය, ත්‍රිකුණාමලය, මන්නාරම, මුලතිව් යන දිස්ත්‍රික්ක සඳහා පිළිවෙලින් පැළ 8,000, 22,000, 13,000 සහ 9,000 ක් වෙන් කර, එම ප්‍රමාණයම බෙදා දීම සඳහා කටයුතු කර ඇති අතර ඒ අනුව වැඩිපුර බෙදා දීමක් සිදු වී නොමැත. අදියර දෙකම යටතේ කළුතර හා රත්නපුර දිස්ත්‍රික්ක සඳහා වෙන් කරන ලද මුළු පැළ ප්‍රමාණ පිළිවෙලින් 54,000,ක් සහ 44,500 ක් වූ අතර කාළගුණික බලපෑමෙන් බෙදීමට නුසුදුසු තත්ත්වයෙන් මැරීමට ලක්වූ පැළ ප්‍රමාණය හේතුවෙන් එම ප්‍රමාණය පිළිවෙලින් පැළ 47,200 ක් සහ 44,099 ක ප්‍රමාණයක් දක්වා අඩුවිය.එමෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කය වෙත පැළ 20,500 ක ප්‍රමාණයක් වෙන් කළ ද පැළ 14,528 ක් පමණක් බෙදා දුන් බවත් ඒ සඳහා පමණක් ගෙවීම් කර ඇති බවත්, වර්ෂාව හේතුවෙන් මුරුංගා පැළ සිටුවීමෙන් පැළ වලට හානි සිදුවිය හැකි බැවින් දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට නොහැකිව ප්‍රමාද වූ බවත් නිරීක්ෂණය වේ.

පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය.

| | | |
|---|---|---|
| (ඍ) දිවයිනේ සෑම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසමකම තෝරාගත් ප්‍රතිලාභී පවුල් 100 ක ගෙවතු දසලක්ෂයක මුරුංගා පැළ සිටුවීමට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 අප්‍රේල් 05 දිනැති අංක 03/2021 දරන චක්‍රලේඛය මගින් උපදෙස් ලබා දී ඇතත් චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව රු.2,353,050 ක් වටිනා පැළ 56,025 ක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. | ජීව තුරු උදාන වැඩසටහන ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද්දේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහාය. මීට අමතරව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය විසින්ද මුරුංගා පැළ සඳහා ඉල්ලුම් කරන ලද අතර මෙම ජාතික වැඩසටහන පෝෂණීය මුරුංගා ප්‍රවර්ධන වැඩසටහනක් බැවින්, එකී ඉල්ලීමට අනුව ඔවුන් සඳහාද මුරුංගා පැළ ලබා දීමේ වැදගත්කම සලකා බලමින්, කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය, ගරු ශශීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා සමඟ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාවේදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය වෙතද මුරුංගා පැළ 157,500ක් ලබා දීමට අනුමැතිය ලැබී ඇත . | පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය. |
| (එ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන 06 කට රු.237,300 ක් වටිනා මුරුංගා පැළ 5,650 ක් බෙදා හැර තිබියදී ව්‍යාපෘතිය මගින් වටිනාකම රු.2,688,000 ක පැළ 64,000 ක් චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව මහවැලි අධිකාරිය වෙත ලබා දී, මහවැලි අධිකාරිය මගින් ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් පැළ බෙදා දුන් ප්‍රදේශයන්ටම බෙදා දී තිබුණි. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය එකම ස්ථානයකට දෙවරක් ලබා දීම මගහැරීම සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත නියෝජ්‍ය /සහකාර කොමසාරිස්වරුන් හා සමස්ථ ලංකා පැළ තවාන් හිමියන්ගේ සංගමයේ නියෝජිතයින් සම්බන්ධීකරණය කරන ලෙස සඳහා උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඒ) පැළ බෙදා දෙන අවස්ථාවේදී ලබා දීම සඳහා මුරුංගා ශාකයේ විස්තර ඇතුළත් රු. 2,100,000 ක වටිනාකමකින් යුත් මුද්‍රිත තාක්ෂණික අත්පත්‍රිකා දස ලක්ෂයෙන් රු. 48,300 ක් වටිනා අත් පත්‍රිකා 26,300 ක් 2022 පෙබරවාරි 18 දින වන විටත් බෙදා නොමැතිව කොළඹ සහ මොණරාගල ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලවල ගබඩා කර තිබුණි. | ජීව තුරු උදාන වැඩසටහනට අදාළ රාජ්‍ය උත්සවය කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය, ගරු ශශීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ සිංහල හා හින්දු අලුත් අවුරුද්දේ හිසතෙල් ගෑමේ නැකතට සමගාමීව 2021.04.17 දින පැවති අතර කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ජනතාවගේ සහභාගීත්වයේ පැවති අඩුව හේතුවෙන් අත් පත්‍රිකා ප්‍රමාණයක් බෙදා දීමට නොහැකිව ඉතිරි විය එසේම, කොළඹ දිස්ත්‍රික්කය තුළ කොවිඩ් වසංගත තත්ත්වය දැඩිව පැතිරුණු බැවින් කාර්යාලයේ නිලධාරීන්ද, එම | පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය. |

රෝගයට ගොදුරු වීම නිසා කාර්යාලය තාවකාලිකව වසා දැමීමට සිදු වි තිබිණි. කෙසේ නමුත්, කොළඹ හා මොණරාගල දිස්ත්‍රික්ක වල එසේ ඉතිරිව පවතින අත් පත්‍රිකා හරිත දැයක් ගෙවතු වගා වැඩසටහන හරහා ජනතාවට බෙදා දීමට නියමිතව ඇත.

### 3.3.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අය නොවූ ශේෂ

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ට යොමු කරන ලද 2021 දෙසැම්බර් 28 දිනැති අංක BD/RE/118/426/04/2021 දරන ලිපිය අනුව එතෙක් පැවති 425 වැය ශීර්ෂය අහෝසි වී 426 වැය ශීර්ෂය හා ඒකාබද්ධවී ඇති අතර, ඒ අනුව එදිනට පැවති ණය ශේෂ සියල්ල 426 වැය ශීර්ෂය වෙත මාරු විය යුතුව තිබුණි. එහෙත් ශීර්ෂයන් 2 අතර නිවැරදිව ණය ශේෂ හුවමාරු කරගැනීමකින් තොරව 425 හා 426 වැය ශීර්ෂයන් වෙනුවෙන් වෙන වෙනම අත්තිකාරම් ගිණුම් 2 ක් පිළියෙල කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ පොත් අනුව රු. 105,720 ක ණය ශේෂයක් 426 වැය ශීර්ෂය වෙත මාරු නොකොට අහෝසිවූ 425 වැය ශීර්ෂය යටතේ සකස් කර ඇති අත්තිකාරම් ගිණුමේ තවදුරටත් ඉදිරියට ගෙන ගොස් තිබුණි. | මෙසේ වීමට හේතුව වී ඇත්තේ භාණ්ඩාගාරයෙන් 42501 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම ශුන්‍ය කළ අවස්ථාවේදී වසා නොදැමීම හේතුවෙනි. 2022 වර්ෂයේදී මෙම මුදල 426 ශීර්ෂය යටතේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට මාරු කර නිවැරදි කර ඇත. | අහෝසිවූ අත්තිකාරම් ගිණුමේ ශේෂය වෙනත් ගිණුමකට මාරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ඉදිරියට ගෙන එන ලද ණය ශේෂය තුළ වැරදි බැරකිරීමක් ලෙස රු. 4,470ක ශේෂයක් ඇතුළත් කර තිබුණු අතර, වැරදි බැරකිරීමට හේතු පරීක්ෂාකර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වැරදි බැර කිරීම 118 ශීර්ෂයෙන් 425 ශීර්ෂයට ශේෂ මාරු කිරීමේදී සිදු වී ඇති වරදකි. නොපමාව එය නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | හඳුනාගත් වැරදි බැර කිරීම නිවැරදි කළ යුතුය. |